# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1720/2 - 2011 අගෝස්තු 22 වැනි සඳුදා - 2011.08.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 07 දරන සමාගම් පනත**

2007 අංක 07 දරන සමාගම් පනතේ 477 වැනි වගන්තිය සමග කියවිය යුතු 527 වැනි වගන්ති යටතේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් පනවන ලද නියෝග.

රිෂාඩ් බදියුදීන්,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය.

2011 අගෝස්තු මස 08 වැනි දින,
කොළඹ දී ය.

සමාගම් (ගාස්තු) නියෝග

2007 අප්‍රේල් 20 වැනි දිනැති අංක 1493/20 *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* හා 2008 සැප්තැම්බර් 12 දිනැති අංක 1566/32 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පළ කරන ලද සමාගම් (ගාස්තු) නියෝග පහත උපලේඛණයේ දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

උපලේඛනය

| අනු. අංකය | 2007 අංක 07 දරන සමාගම් පනත | සංශෝධිත ගාස්තුව |
|---|---|---|
| 1 | සීමාසහිත සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා | රු. 10,000.00 |
| 2 | සීමාරහිත සමාගමක් ලියපදිංචි කිරීම සඳහා | රු. 7,500.00 |
| 3 | ඇපයෙන් සීමාසහිත සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා | රු. 15,000.00 |
| 4 | උගස්කර බැඳීම් හා ණයපත්‍ර ලියාපදිංචි කිරීම සඳහා | රු. 1,000.00 |
| 5 | වාර්ෂික වාර්තාවක් ලියාපදිංචි කිරීම සඳහා | රු. 3,000.00 |

1A - G 14962— 830 (2011/08)

උපලේඛනය (සම්බන්ධිතයි)

| අනු. අංකය | | සංශෝධිත ගාස්තුව |
|---|---|---|
| 6 | දේපළ භාර ගැනුම්කරුවකු හෝ කළමනාකරුවකු හෝ අද්මිනිස්ත්‍රාත්සිකරුවකු හෝ ඇවරකරුවකු විසින් සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට භාර දිය යුතු යැයි නියම කරනු ලැබ ඇති දැන්වීම් සහ වාර්තා හැර ලියාපදිංචි කළ යුතු යැයි නියම කරන ලද හෝ බලය දෙන ලද හෝ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට භාර දිය යුතු යැයි, යැවිය යුතු යැයි, දිය යුතු යැයි හෝ ඉදිරිපත් කළ යුතු යැයි හෝ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ගොනු කළ යුතු යැයි හෝ නියම කරන ලද යම් ලේඛණයක් ලියාපදිංචි කිරීම | රු. 500.00 |
| 7 | සමාගමක නාමයක් අනුමත කිරීම සඳහා | රු. 500.00 |
| 8 | සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් තබාගෙන ඇති ලිපිගොනුවක් පරීක්ෂා කිරීම සඳහා | රු. 200.00 |
| 9 | සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත යොමු කර ඇති යම්කිසි ලේඛණයක් හෝ එහි උද්ධෘතයක් සහතික කිරීම සඳහා | රු. 250.00 |
| 10 | බැඳුම්කර ලේඛනය පරීක්ෂා කිරීම සඳහා | රු. 200.00 |
| 11.1 | සමාගම් ලේකම්වරු ලෙස තනි පුද්ගලයින් ලියාපදිංචි කිරීම | රු. 1,500.00 |
| 11.2 | සමාගම් ලේකම්වරු ලෙස තනි පුද්ගල ව්‍යාපාර/හවුල් ව්‍යාපාර ලියාපදිංචි කිරීම | රු. 3,000.00 |
| 11.3 | සමාගම් ලේකම්වරු ලෙස සී/ස සමාගම් ලියාපදිංචි කිරීම | රු. 4,000.00 |
| 12 | අක්වෙරළ සමාගමක් සිය කාර්යාලය පවත්වාගෙන යාම සඳහා වියදම් වෙනුවෙන් බැංකුවක බැර කල යුතු ප්‍රමාණය | ඇ.ඩො.70,000.00 |
| 13 | අක්වෙරළ සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා | රු. 60,000.00 |
| 14 | විදේශ සමාගමක් විසින් ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ස්ථානයක් ලියාපදිංචි කිරීම සඳහා | රු. 30,000.00 |
| 15.1 | 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ජනතා සමාගමක් වශයෙන් ගැමිදිරිය සමාගම් යෝජනා ක්‍රමය යටතේ පිහිටුවන ලද සමාගමක් නැවත ලියාපදිංචි කිරීම සඳහා | රු. 1,000.00 |
| 15.2 | වෙනත් යම් පවත්නා සමාගමක් (විදේශ සමාගමක් හැර) නැවත ලියාපදිංචි කිරීම සඳහා | රු. 5,000.00 |
| 15.3 | අක්වෙරළ සමාගමක් අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා එහි ලියාපදිංචිය අලුත් කිරීම | රු. 60,000.00 |

09-174

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.